" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2020 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020-05-21 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්,

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 39/2019, 01/2020, 35/2019(I), 02/2020, 22/99 (XXXVIII) හා 04/2020 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2/19/01/2020 හා 2020.03.12 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 39/2019, 2019-12-31 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2138/27 හා 2019.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2020, 2020-01-14 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/89 හා 2019 අගෝස්තු මස 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 35/2019(I), 2020-01-20 | රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සංශෝධනය - 2016 |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2020, 2020-02-03 | ප්‍රමිතිකරණය කරන ලද භූගෝලීය නාම භාවිතා කිරීම |

| | | |
|---|---|---|
| 05. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99(XXXVIII), 2020-02-08 | රාජ්‍ය නිලධරයන්/ පළාත් රාජ්‍ය නිලධරයන්/ අධිකරණ නිලධරයන් සඳහා නිල ප්‍රවාහන පහසුකම් |
| 06. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2020, 2020-02-18 | ස්පීඩ් පෝස්ට් හා ලොජි පෝස්ට් කුරියර් සේවාවන් භාවිත කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2020

මගේ අංකය : EST-1/MISCL/06/0047
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.02.03

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>ප්‍රමිතිකරණය කරන ලද භූගෝලීය නාම භාවිතා කිරීම</u>**

2014.12.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ශ්‍රී ලංකාවේ භූගෝලීය නාම ප්‍රමිතිකරණය සඳහා පිහිටුවන ලද භූගෝලීය නාම ප්‍රමිතිකරණ කමිටුව විසින් ස්ථානීය නාම, ස්වභාවික භූගෝලීය අයිතමයන්, මාර්ග හා ජල මාර්ග යනාදී ලක්ෂ පහක පමණ භූගෝලීය නාම සංඛ්‍යාවක් ප්‍රමිතිකරණයෙන් අනතුරුව www.geonames.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.

02. එම වෙබ් අඩවියෙහි ඇතුළත් කර ඇති ප්‍රමිතිකරණය කරන ලද අනන්‍ය වූ භූගෝලීය නාම මින් ඉදිරියට සියලුම රාජ්‍ය ආයතන විසින් සිය රාජකාරී කටයුතුවලදී භාවිතා කිරීම මඟින් පරිපාලන සහ සන්නිවේදන කටයුතු වඩා ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කළ හැකි වේ. තවද ස්ථාන පදනම් කරගත් සේවාවන් කාර්යක්ෂම කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පදනම මෙමඟින් සැකසෙන බැවින් අවශ්‍ය අවස්ථාවලදී භූගෝලීය නාම භාවිතා කිරීම සඳහා ඉහත සඳහන් වෙබ් අඩවිය මඟින් නාම ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ.

03. භූගෝලීය නාම ප්‍රමිතිකරණ දත්ත පද්ධතිය භාවිතා කිරීමේදී නාමයන් පිළිබඳව යම් ගැටලුවක් වෙතොත් එම ගැටලු www.geonames.gov.lk වෙබ් අඩවිය හරහා ඉදිරිපත් කළ හැකි අතර, වැඩිදුර තොරතුරු සඳහා පහත දුරකථන අංක අමතා සහය ලබා ගත හැක.

| | | |
|---|---|---|
| මිනින්දෝරු අධිකාරී (භූගෝලීය නාම) | - | 011-2368599 |
| ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (සිතියම්කරණ හා භූගෝලීය නාම) | - | 011-2581960 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (සිතියම්කරණ හා භූගෝලීය නාම) | - | 011-2369586 |

04. මෙම චක්‍රලේඛය 2018.09.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ එකඟතාව මත නිකුත් කෙරේ.



එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය